# ගම අවුලක්කදං



ගී සඳලුව
Gee... Sandaluwa



සිසිර දිසානායක

"මේ අවුරුදු
කාලේ - හිනා වෙයන් රාළේ
තෙල් ඉහිරුණු කැවුම් ගෙඩිය වාගේ ....."

මේ සිංහල අවුරුදු කාලයේ අපේ මව්බිමේ නිතර අහන්න ලැබෙන සින්දුවක්. හරියට සිංහල අවුරුදු උත්සවයේ තේමා ගීතය වගේ. ලිව්වෙ ජයම්පති අල්ගම මහත්තයා. ජන ගී නාද රටා අනුව සංගීතය,තනුව නිර්මාණය කරගෙන තමුන්ගේ ගෝල බාල කට්ටියත් එක්ක ගායනා කළේ මීට අවුරුදු දොළහකට විතර කලින් අපි අතරින් වෙන් වුණ ලයනල් රන්වල මහත්තයා.

අපේ ගම් බිම් වල උන්නු අපේ කට්ටිය තමන්ගේ හිතට ආව දේවල් තමන්ට හිතෙන තාලවලට ගායනා කළා. මේ දේවල් තමුන් එදිනෙදා කරන කියන දේවල් වලට, සිරිත් විරිත් වලට සම්බන්ධ දේවල්. ජන ගායනා කියල අද අපි කියන මේ ගායනා කාටත් අයිති දේවල් කටින් කට තමයි පැවත ගෙන ආවෙ. ඉතින් ගමින් ගම ගිහින් ඔය දේවල් එකතු කරගෙන, ඒවාට ස්වර ප්‍රස්ථාර හදලා පොත් පත් වල ලියලා අපේ දරුවන්ටත් ඒ දේවල් හුරු කර- වන්න මුලික වුණේ ඩබ්ලිව්.බී.මකුලොළු කියන මහත්තයා. ඒ මහත්තයාට හවුල් වුණ අය අතරේ සී.ද ඇස්. කුලතිලක මහත්තයාත් මුලටම උන්නා. ඔය සද්කාරියට පස්සෙ එකතු වුණ අයගෙන් කෙනෙක් තමයි ලයනල් රන්වල මහත්තයා. ජන ගී නාද මාලා වල විදියට හදපු තනු වලට ගැමි වචන යොදා ගෙන තමුන්ගේ ගෝල පිරිසක් එක්ක, රඟපාන ගමන් ඉදිරිපත් කරපු එතුමාගේ ප්‍රසාංගික ජන ගී කලාව වෙනම ම කලාවක් වුණා. ඒකට දේශන, නැටුම් එහෙමත් එකතු වුණා. ඔය දේවල් එකතු කරලා ඉහළින් ම පවත්වපු ප්‍රසංගය තමයි "ගම අවුලක්කදං" ප්‍රසංගය. මේ වෙන කොට වාර 700කට වඩා මේ ප්‍රසංගය ලංකාවෙයි පිට රටවලයි පවත්වලා තියෙනවා. ඉතින් මැයි මාසෙ 31 දා මෙල්බර්න් නුවරත් මේ ප්‍රසංගය වේදිකාගත කරන්න " ලක්මැදුර පදනම" සුදානම් වෙනවා.

ලයනල් රන්වල මහත්තයා නැති වුණාට පස්සේ මේ දේවල් ඉස්සරහට කරගෙන ආවෙ ඒ මහත්තයාගේ පුතා, සහන් රන්වල මහත්තයා මුල් වුණා. "රන්වල බලකාය යි". රටවල් 66 ක් එක්ක තරඟ වැදිලා ලෝකයේ හොඳම ප්‍රාසාංගික ජන ගී කණ්ඩායම විදියට චීනයේ දී සම්මාන ලබා ගත්තේ මේ රන්වල බලකායයි. ඉතින් මැයි මාසයේ පවත්වන්න සුදානම් වෙන
"ගම අවුලක්කදං" ප්‍රසංගය ගැන කතා කරන්න අපි ගී සඳළුවට ආරාධනා කළේ සහන් රන්වල මහත්තයාට.

"ඇත්තටම හරිම සතුටට කාරණයක් මෙල්බන් නුවර අපේ ප්‍රසංගය පවත්වන්න ලැබුන එක. මම මීට කලින් වතාවක් මෙල්බන් නගරයට සංචාරයකට ආව නිසා මම දන්නවා මෙල්බන් වල ඉන්න කට්ටිය ගැන. ඇත්තටම මට දැණුනා අපේ ලංකාවේ ගතිය. උදාහරණයක් විදියට කිව්වොත් මං ඉගෙන ගත්ත ආනන්ද විද්‍යාලයේ 97 වසරේ ආදි ශිෂ්‍ය කණ්ඩායමේ අය මෙල්බන් වලදී මුණ ගැහුණා එක රැයකදී. ඒ තරම් අපේ කණ්ඩායමේ කට්ටියත් ලංකාවෙදී වුණාත් මුණගැහෙන්නෙ කලාතුරකින්. ඒ මුණ ගැහුණ හැමෝම ගාව අපේකම රැඳිලා තිබුණා. අපි දැනට චීනය, ඉන්දියාව,සයිප්‍රසය,ඩුබායි,කුවේට් වගේ රටවල් වල ප්‍රසංග පවත්වලා තියෙනවා. ඒත් මෙල්බන් කෙටි සංචාරයේදි දැනුන ලෙන්ගතුකම ඒ තැන්වලදී එතරම් ම දැණුනෙ නෑ. ක්‍රිකට් ක්‍රීඩාවෙදි පිතිකරණයට රුකුලක් වෙනවානේ දන්න අය ක්‍රීඩාගාරයේ ඉන්න එක. ඒ වගේ තමයි අපේ ප්‍රේක්ෂකාගාරයේත් දන්න කියන අය ගොඩක් ඉන්න එක අපට ලොකු හයියක්." රන්වල බලකාය මෙල්බන් නුවර එන්න කලින් යුරෝපයේත් ප්‍රසංග පවත්වන්න යන්න නියමිතයි.

"ඉතින් අපි අපේ කණ්ඩායම ගැන කියන්න ඕන නෑනේ. දැන් හැමෝම දන්නවා අපි ලෝකයේ හොඳම ජන ගී කණ්ඩායම විදියට සම්මාන දිනපු බව. ඒත් තවමත් සමහර අය අපි ගැන හිතන්නේ සිංහල අවුරුදු කාලයට විතරක් වැඩ කරන ඒ ගැන විතරක්. සින්දු ගායනා ඉදිරිපත් කරන කණ්ඩායමක් විදියට. මේ වෙනකොට අපි ගීත සීයකට වැඩිය නිර්මාණය කරලා තියෙනවා. ඒ අතරින් අවුරුදු සින්දු තියෙන්නේ අතලොස්සයි. අපි නිකුත් කරලා තියෙන "අහසෙ ඉන්නවලු", "ගම අවුලක්- කදං","ත්‍රී", "යුද්දෙටත් ඇවිත්", "පොඩි අයට ජන ගී","අපේ අවුරුද්දට අපේ ගායනා" සංගත තැටි හැම එකක් ම වෙනුවෙන් ප්‍රසංගත් තියෙනවා. ලංකාවෙදී මේ ප්‍රසංග වෙන වෙනම ප්‍රසංග හැටියට ඉදිරිපත් කළත්, විදේශ රටවල් වලදි "ගම අවුලක්කදං"ප්‍රසංගයට අනික් ප්‍රසංග වල තියෙන විශේෂ අංගයත් එකතු කරලා එක ප්‍රසංගයක් විදියටයි ඉදිරිපත් කරන්නෙ. මේ නිසා අපට පුළුවන් කවුරුත් හිතන්නෙ නැති විදියට ජන ගායනා වලින් නිර්මාණය කරපු දේවල් ඉදිරිපත් කරන්න. දැන් උදාහරණයක් විදියට සුරේන්ද්‍ර පෙරේරායි, උරේෂා රවිහාරියි ගායනා කරපු ගීතය චිත්‍රපටි ගීතයක්. ඉතින් අපට ඕන කරන්නේ ජන ගී වලින් මේ දේවල් කරන්න පුළුවන් බව පෙන්නන්නයි.

රන්වල බලකායට මේ වෙන කොට ලංකාවේ තියෙන පිළිගැනීම ගැනත් මතක් කරන්න ඕන.

"ළඟදී පැවැත්වුණ චෝගම් සමුළුවට අපිට අංග ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබුණා. ඒ වගේම "ජැෆ්නා මියුසික් ෆෙස්ටිවල්" ජාත්‍යන්තර උත්සවය, ගොල් මියුසික් ෆෙස්ටිවල්" කොළඹ ප්‍රසංගය වාගේ ප්‍රසංග වල මුල්ම අංගය ඉදිරිපත් කරන්න අපි ආරා- ධනා ලැබුවා. මේ මෑතක දේවල් විතරයි. නිතර අපට මේ වාගේ අවස්ථාවල් ලැබෙනවා.

ලංකාවේ අපේ ප්‍රසංග වල කිසිම අවස්ථාවක හිස් පුටු දකින්නේ නෑ. හිටගෙනත් ඉන්න පිරිසක් හුඟක් වෙලාවට දකින්න ලැබෙනවා. කොයිතරම් ප්‍රසංග රට පුරා පැවැත්වුණාත් අපි ඉදිරිපත් කරන දේ අනිත් ඒවායේ දකින්න ලැබෙන්නෙ නෑ. දේශීය සංගීතය නවීණාත්වයෙන් පොහොසත් කරලා නුතන මා- නයන්ගෙන් මැණිය හැකි ප්‍රසංග විදියටයි අපි ඉදිරිපත් කරන්නෙ. ඒ අත්දැකීම කාට වුණාත් අමුතු දෙයක් වෙනවා නිසැකයි.
ලංකාවෙදී මේ ප්‍රසංග බලපු අයට වුණාත් අපි විදේශ වලදී ඉදිරිපත් කරන ප්‍රසංගය වෙනම ම අත්දැකීමක් වේවි. නාට්‍යයක් නම් එකම දෙයක් නෙ කොහේදිත් ඉදිරිපත් කෙරෙන්නේ. අපි "ගම අවුලක්කදං" ප්‍රසංගය ඒ ඒ අවස්ථාවේ හැටියටත් වෙනස්කම් කරනවා. ඒත් ඒ මුලික දේවල් ඒ විදියට ම තියාගන්න ගමන්.

"අපි ලංකාවේ විවිධ ප්‍රදේශවල ප්‍රසංග, දේශන වැඩමුළු පවත්වන කොට ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන මේ දේවල් වලට දක්ෂ අයවත් සහභාගි කරවා ගන්නවා. ඒකෙන් තමන් අතරෙම ඉන්න දක්ෂයින්ව ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන අනික් අය අඳුනා ගන්නවා. ඒ වගේම ඒ දක්ෂයෝ අපිට එකතු වෙනවා. ඉතින් ඔය විදියටයි අපේ කණ්ඩායම දක්ෂම කණ්ඩායමක් වෙලා තියෙන්නේ"

ඉතින් ඔය වගේම වෙන රටවල් වලදී කරන ප්‍රසංග වලදී ඒ රටවල් වල ඉන්න අපේ අයවත් සම්බන්ධ කර ගන්නවා. දැන් මෙල්බන් ප්‍රසංගයේදී "ලොකු වුණාම කවුද වෙන්නෙ?" ගීතය ඉදිරිපත් කරන ගුරුවරිය අපෙන්. ශිෂ- ්‍යයෝ මෙල්බන් වලින්. ඇත්තටම අපි කැමති නෑ "ඒලියන්ස් "ලා වගේ ඇවිත් ප්‍රසංගය පවත්වලා යන්න. අපි සිඩ්නි වල බක්මහ රංගන ප්‍රසංගයට කරපු අංගත් ඉදිරිපත් කළේ එහේ දූ දරුවන් එක්ක".

"මේ වාගේ දේවල් නිසා මේ ප්‍රසංගය අපේ පුරුදු රසිකයින්ටත් වෙනස් අත්දැකීමක් වෙයි. ඒ නිසා අපේ රසිකයන්ටත් මෙතෙක් අපේ දේවල් දැකලා නැති අපේ ආදරණීය ශ්‍රී ලාංකික පිරිසටත් අපි ආදරෙන් ආරාධනා කරනවා ලක්මැදුර පදනමෙන් සංවිධානය කරන "ගම අවුලක්කදං" ප්‍රසංගය විඳින්න අපිත් එක්ක මැයි 31 දාට එකතු වෙන්න කියලා ......" තමන්ගේ දේ අගය කරන හැමෝම වෙනුවෙන් සහන් රන්වල මහත්තයා තමුන්ගේ ලෙන්ගතු ආරාධනාව කළා.

ඇත්තටම නොපුරුදු අත්දැකීමක් ලබාගන්න පුළුවන් ප්‍රසංගයක් වෙනුවෙන් ඒ දවස වෙන් කරගන්න කියලා කාටත් ආයෙමත් මතක් කරන ගමන් අපි සහන් රන්වල මහත්තයාට ස්තුති කළා මේ පිළිසඳරට එක් වුණාට.

*ගම අවුලකඳකද්ං*
*හබ පටලකද්කදං*
*ගිනි ගෙඩි දෙකද්කදං*
*දෙකද්කදං දෙකද්කදං*

*සුදුවට පිරුවට ඇඳගෙන එන්නෙ*
*දානෙට සීලෙට මුලටම ඉන්නේ ?*
*වයසට යනකොට මොනවද වෙන්නෙ?*
*කටවට කර වැට කොහොම බඳින්නේ?*

*දොම් දොම් කිට කිට දොම් දොම්*

*කේළම් ඕපා දූප - කියමින් ගම වට යාම*
*සතුටකි නුඹට කදිම - මැගි නැන්දේ ......*

*අහළ පහළ කෙටවීම - සිරිතකි නුඹෙ හැමදාම*
*කොතැන ද ඔහොම ගියාම- නවතින්නේ ?*

*හොරණෑ ඕසය,ගජමන් නෝනාගේ කවි, ගුඩු ක්‍රීඩා කවි*
*සහ බෙර පද ඇසුරින්*
*තනු නිර්මාණය හා ගායනය : ලයනල් රන්වල ඇතුළු පිරිස*
*තනුවට අනුව පද රචනය : සිසිර දිසානායක*

සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්

**VCE Chemistry 2014**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546